Australian Government
Department of Immigration and Citizenship

# ප්‍රශංසා සහ පැමිණිලි





## ප්‍රශංසාවක් හෝ පැමිණිල්ලක් කරන්නේ කෙසේද?

ප්‍රශංසාවක් හෝ පැමිණිල්ලක් කිරීමට ඔබ කල යුත්තේ:

- දුරකථන අංක 133 177 (ඕස්ට්‍රේලියාව තුල නොමිළේ කථා කල හැකි අංකයකි) ඔස්සේ කාර්යාල වේලාවල ග්ලෝබල් ෆීඩ්බැක් යුනිට් (Global Feedback Unit) අමතන්න.
- www.immi.gov.au වෙබ් අඩවිය ඔස්සේ ප්‍රතිචාර ෆෝරමයක් සම්පූර්ණ කරන්න.
- පහත ලිපිනය වෙත ලියන්න:
  The Manager
  Global Feedback Unit
  GPO Box 241
  MELBOURNE VIC 3001
  AUSTRALIA
- ළඟම ඇති DIAC කාර්යාලය වෙත ගොස් අප හමුවන්න.

## ප්‍රශංසාවක් හෝ පැමිණිල්ලක් කල හැක්කේ කුමක් සඳහාද?

දෙපාර්තමේන්තුව මගින් ලබාදෙන සේවාවන් හෝ ලබාදෙන අරමුදල් සම්බන්ධ ප්‍රශංසාවක් හෝ පැමිණිල්ලක් ඔබ හට කල හැක. වීසා තීරණයක් සම්බන්ධව ඔබ සතුටු නොවේ නම්, තීරණය සම්බන්ධව විමර්ශණයකට ඔබට අයිතිය තිබිය හැක. දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වන www.immi.gov.au ඔස්සේ ඔබට වැඩිදුර විස්තර ලබා ගත හැක.

## මාගේ පැමිණිල්ල සම්බන්ධව දැන ගන්නේ වෙන කවුරුන්ද?

ඔබගේ පෞද්ගලිකභාවය සහ රහස්‍යභාවයට ගරු කරන අතර ආරක්ෂා කරදේ. ඔබගේ නම ලබාදීමට අකමැති නම් එය ලබා දිය යුතු නැත. ඔබගේ නම ලබා දුනහොත්, ඔබව වෙනස්කමකට ලක් නොකරන අතර අප සමග කටයුතු කිරීමේදී අවාසි සහගත තත්වයකට පත් නොකරනු ඇත.

## මේ සඳහා කොතෙක් කල් ගතවේද?

ඔබගේ පැමිණිල්ල දුරකථන හෝ ඊමේල් මගින් කලහොත්, දිනයක් ඇතුලත එය ලද බව දැනුම් දෙන අතර වැඩ කරන දින 10 ක් ඇතුලත ප්‍රතිචාර දක්වනු ඇත.

ඔබගේ පැමිණිල්ල තැපැල් මගින් කලහොත්, දින පහක් ඇතුලත එය ලද බව දැනුම් දෙන අතර වැඩ කරන දින 20 ක් ඇතුලත ප්‍රතිචාර දක්වනු ඇත.

## ඕස්ට්‍රේලියාව ඇතුලතදී ප්‍රශංසාවක් හෝ පැමිණිල්ලක් කිරීමට මට උපකාර අවශ්‍ය නම් කුමක් සිදුවේද?

ඔබට භාෂා පරිවර්තකයෙකු අවශ්‍යනම්, නොමිළේ කථාකල හැකි දුරකථන අංක 131 450 ඔස්සේ පරිවර්තන සහ තෝල්ක සේවාව (Translating and Interpreting Service - TIS) අමතන්න.

☏ ඔබට ඇසීම, කථා කිරීම හෝ සන්නිවේදනය සම්බන්ධ ආබාධ ඇතිනම්, ජාතික සහායක සේවාව (National Relay Service (NRS)) ඔස්සේ අප හා සම්බන්ධවිය හැක. ටෙක්ස්ට් දුරකථන (Text telephone (TTY)) හෝ මෝඩම් මගින් අමතන්නන් (modem callers) හට නොමිළේ කථා කල හැකි NRS අංක 133 677 ඔස්සේ අප හා සම්බන්ධ විය හැක.

ඔබට කථාකිරීම හා කථාකිරීම සම්බන්ධ සහාය (Speech to Speech Relay (SSR)) අවශ්‍යනම්, නොමිළේ කථා කල හැකි (NRS) අංක 133 677 ඔස්සේ ජාතික සහායක සේවාව (National Relay Service) හා සම්බන්ධවිය හැක.

## මම තවදුරටත් සතුටු නොවේනම් කුමක් කල යුතුද?

අප ඔබගේ පැමිණිල්ල ගැන කටයුතු කල ආකාරය සම්බන්ධව ඔබ තවදුරටත් සතුටු නොවේනම් ඔබට පහත ලෙස කටයුතු කල හැක:

- ග්ලෝබල් ෆීඩ්බැක් යුනිට් (Global Feedback Unit) අමතා විස්තර ලබා දිය හැක
- දුරකථන අංක 1300 362 072 (ප්‍රාදේශීය ඇමතුම් ගාස්තුවකට) ඔස්සේ සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. 9 සිට ප.ව. 5 දක්වා කොමන්වෙල්ත් ඔම්බඩ්ස්මන්වරයා අමතන්න නැතිනම් ombudsman@ombudsman.gov.au වෙත ඊමේල් පණිවුඩයක් යවන්න.
- ඕස්ට්‍රේලියාවේ පාර්ලිමේන්තු නියෝජිතයෙකු හමුවන්න.

## වෙනත් වැදගත් සම්බන්ධවිය හැකි ආකාර

### ඕස්ට්‍රේලියාව තුල

සාමාන්‍ය විමසීම් හෝ තොරතුරු ඉල්ලා සිටීම සම්බන්ධ විමසීම් අපගේ නොමිළේ කථා කල හැකි සාමාන්‍ය දුරකථන අංකය වන 131 881 වෙත යොමු කරන්න. නැතිනම් අපගේ www.immi.gov.au වෙබ් අඩවිය වෙත යන්න.

ඕස්ට්‍රේලියානු පුරවැසිභාවය සම්බන්ධ විමසීම් අපගේ ඕස්ට්‍රේලියානු පුරවැසි විමසීම් දුරකථන අංක 131 880 වෙත යොමු කල යුතුය නැතිනම් අපගේ වෙබ් අඩවිය වන www.immi.gov.au වෙත යන්න.

### ඕස්ට්‍රේලියාවෙන් පිටත

ඔබට ළඟම ඇති ඕස්ට්‍රේලියානු තානාපති කාර්යාලය, කොන්සියුලේට් හෝ මහා කොමසාරිස් කාර්යාලය තුල සිටින කාර්ය මණ්ඩල සාමාජිකයෙකු හට කථා කරන්න. සම්බන්ධවීමේ විස්තර සඳහා ඔබගේ ප්‍රදේශීය දුරකථන නාමාවලිය හෝ අපගේ www.immi.gov.au වෙබ් අඩවිය වෙත යන්න.

ඔබගේ පෞද්ගලිකභාවය ආරක්ෂා කර ගැනීම සම්බන්ධ වැඩිපුර විස්තර www.privacy.gov.au වෙබ් අඩවිය වෙතින් ලබා ගන්න.

ඕස්ට්‍රේලියානු ගමන් බලපත්‍ර සම්බන්ධ තොරතුරු සඳහා වෙබ් අඩවිය හෝ දුරකථන අංක 131 232 (නොමිළේ කථා කල හැකි) ඔස්සේ විදේශ කටයුතු සහ වෙළඳාම පිළිබඳ දෙපාර්තමේන්තුව (Department of Foreign Affairs and Trade (DFAT)) හා සම්බන්ධවන්න. නැතිනම් ඔබට ළඟම ඇති ඕස්ට්‍රේලියානු තානාපති කාර්යාලය, කොන්සියුලේට් හෝ මහා කොමසාරිස් කාර්යාලය හා සම්බන්ධවන්න (www.dfat.gov.au වෙබ් අඩවිය බලන්න).

දෙපාර්තමේන්තුවේ ඕනෑම සේවාවක් සම්බන්ධයෙන් ප්‍රශංසා හෝ පැමිණිලි කිරීමට අවශ්‍යනම්, කරුණාකර කාර්යාල වේලාවල දුරකථන අංක 133 177 (ඕස්ට්‍රේලියාව තුල නොමිළේ කථා කල හැකි අංකයකි) ඔස්සේ අමතන්න, අපගේ වෙබ් අඩවිය www.immi.gov.au වෙත යන්න නැතිනම් අපගේ වෙබ් අඩවිය www.immi.gov.au ඔස්සේ ඔබට ළඟම ඇති ඕස්ට්‍රේලියානු තානාපති කාර්යාලය, කොන්සියුලේට් හෝ මහා කොමසාරිස් කාර්යාලය හා සම්බන්ධවන්න.

DIAC07/00437


© Commonwealth of Australia [2007]